# න්‍යායබින්ධාගත අනුපලබ්ධි ලිඞ්ගය පිළිබඳ විමසීමක්

පූජ්‍ය පැපිලියවල නාරද හිමි

## හැඳින්වීම

බෞද්ධ තර්ක ශාස්ත්‍රය හැදෑරීමෙහි ලා න්‍යායබින්දුවෙන් ලැබෙන ආලෝකය ඉමහත් ය. පරිච්ඡේද ත්‍රයකින් සමන්විත මෙම කුඩා කෘතියෙහි බෞද්ධ තාර්කික සිද්ධාන්ත සංක්ෂේපයෙන් ඉදිරිපත් කරයි. එහි ලා පැනෙන අනුපලබ්ධි ප්‍රභේද එකොළොස පිළිබඳ විමසීමක් මෙම ලිපියෙන් සිදු කෙරේ.

## ප්‍රවේශය

බෞද්ධ තර්ක ශාස්ත්‍රයෙහි කූටප්‍රාප්තිය සනිටුහන් කරන්නෝ ආචාර්ය ධර්මකීර්ති පාදයෝ ය. එ හිමි විසින් ප්‍රණීත යැයි සැලකෙන කෘති සප්තකය[1] අතුරින් න්‍යායබින්දුව ප්‍රාමාණිකත්වයෙහි ලා ගිණිය හැක්කේ එ ද උන් වහන්සේගේ මෞලික දර්ශනය ඇතුළත් ප්‍රමාණවාර්තිකයට කරන ලද සංක්ෂිප්ත සටහනක් වන හෙයිනි. න්‍යායබින්දුව මූලික පරිච්ඡේද ත්‍රිත්වයකින් සමුපේත වන අතර එහි ප්‍රථම පරිච්ඡේදයෙන් ප්‍රත්‍යක්ෂය පිළිබඳවත් ද්විතීය පරිච්ඡේදයෙන් ස්වාර්ථානුමානය පිළිබඳවත් තෘතීය පරිච්ඡේදයෙන් පරාර්ථානුමානය පිළිබඳවත් කරුණු දක්වා ඇත. මෙහි ද්වීතීය පරිච්ඡේදයෙන් විස්තර කෙරෙන ස්වාර්ථානුමානය ඥානාත්මක වන අතර තෘතීය පරිච්ඡේදයෙන් දැක්වෙන පරාර්ථානුමානය ශබ්දාත්මක වෙයි.[2] යම් අනුමානයකින් හෙවත් යම් වස්තුවක් අනුව වන දැනුවත් භාවය මගින් තමා ලබන අවබෝධය ස්වාර්ථානුමානය වෙයි. එනම්, ඉන්ද්‍රිය ගෝචර නො වූ වස්තුවක හේතුව (ලිඞ්ගය) ආශ්‍රය කොට ගෙන එම ඉන්ද්‍රියගෝචර නො වූ වස්තුව පිළිබඳ තමා තුළ ඇති වන ඥානය යි. එහි හේතුව හෙවත් ලිඞ්ගයෙහි ස්වරූප තුනකි.[3] සවාර්ථානුමානය මගින් තමා ලබා ගත් ඥානය වචන මාධ්‍ය කොට ගෙන අනෙකාට වටහා දීම පරාර්ථානුමානය නම්.[4] මෙම ද්විධානුමානය අතුරින් ස්වාර්ථානුමානය විශිෂ්ටත්වයෙහි ලා ගිණිය හැක්කේ තමා ලබන අවබෝධයෙන් තොර ව අනෙකාට යමක් අවබෝධ කරවීම අපහසු වන හෙයිනි. මේ හේතුවෙන් න්‍යායබින්දුව ස්වාර්ථානුමානය යටතේ ලිඞ්ගය අනුමානයේ දී උපයෝගී කොට ගත හැකි ආකාර ත්‍රිත්වයක් දක්වයි.[5] ඒ, අනුපලබ්ධි ලිඞ්ගය, ස්වභාව ලිඞ්ගය හා කාර්ය ලිඞ්ගය වශයෙනි.

## අනුපලබ්ධි ලිඞ්ගය

උපලබ්ධි යන වචනය **නයාායබින්දුවෙහි** පමණක් නො ව **කථාවත්‍ථුප්පකරණයෙහි** පවා පැනෙන්නකි. **කථාවත්‍ථුප්පකරණ** ආරම්භයේ දී ම සත්‍යාර්ථ හා පරමාර්ථ වශයෙන් පුද්ගලයෙක් උපලම්භ්‍යමාන වේ ද යනුවෙන් සකවාදියා විසින් විමසයි. මෙහි දී 'උපලබ්භති' යන වචනය ප්‍රත්‍යක්‍ෂය යන අරුත් සහිත ව දක්වෙයි.[6] Stcherbatsky අනුපලබ්ධි යන පදය ඉංග්‍රීසියට පර්වර්තනය කරනුයේ negation වශයෙනි. එහි සිංහලාර්ථය වනුයේ 'ප්‍රතිශේධනය, නිශේධනය, අහෝසි කිරීම' යන්න යි.[7] එහෙත් අනුපලබ්ධිය මගින් යමක වස්තු ප්‍රතිෂේධය තහවුරු කරන හෙයින් ඊට වඩාත් නිවැරදි අර්ථ කථනය ලෙස 'ඉන්ද්‍රිය ගෝචර නොවීම' යන පදය හඳුන්වා දිය හැකි ය. ඉංග්‍රීසි භාෂාවෙන් non-perception, non-cognition මෙන් ම non-apprehension යන වචන ද අනුපලබ්ධි ව්‍යවහාරය සඳහා යෝග්‍ය යැයි සැලකීම යුක්ති යුක්ත ය.

යමක් ප්‍රතිෂේධ හෝ අභාව කරන්නේ නම් පළමු ව යමක ඇති බව හෙවත් අස්තිත්වය පිළිගත යුතු ය. එහෙත් බෞද්ධයෝ වස්තුවල අස්තිත්වය ප්‍රතික්ෂේප කරන්නාහ. එසේ ම යමක නාස්තිත්වය නොහොත් අභාවය තහවුරු කරන්නේ නම් එවිට නාස්තිත්වය පිළිගත්තාහු ය. එ හෙයින් බෞද්ධ තාර්කිකයන් අනුපලබ්ධිය මගින් තහවුරු කරන්නේ යමක අභාව ව්‍යවහාරය යි. ව්‍යවහාරය වූ කලී සම්මුති ලෝකයේ පවතින්නක් විනා පරමාර්ථික සත්‍යය හා සම්බන්ධ වූවක් නො වේ.

අනුපලබ්ධිය පිළිබඳ ඉගැන්වීම බෞද්ධ තාර්කිකයන් පමණක් නො ව මීමසංසා, න්‍යාය ආදි දාර්ශනිකයන් විසින් ද පිළිගන්නා ලද්දකි. මුල් බුදුසමයෙහි පවත්නා දෙයක් දත හැකි ක්‍රමයක් හෙවත් ප්‍රත්‍යක්‍ෂය පිළිබඳ මනා විග්‍රහයක් තිබුණ ද නොපවතින හෝ නොමැති යමක් නොපතින බව හෙවත් නො දන්නා බව දැන ගත හැක්කේ කෙසේ ද යන්නට පැහැදිලි විග්‍රහයක් නො තිබිණි. නිදසුන් ලෙස යම් බාහිර වස්තුවක් පවත්නේ ද චක්‍ෂු ඉන්ද්‍රිය ඒ බාහිර වස්තුව කෙරේ ආපාථ වූයේ ද ඒ දෙකෙහි සන්නිකර්ෂයෙන් චක්‍ෂු විඥානය පහළ වූයේ ද එවිට එම බාහිර වස්තුව ඇති බව අපට දැන ගත හැකි ය.[8] මේ ආශ්‍රයෙන් අන් ඉන්ද්‍රිය සියල්ල මගින් ඒ ඒ ඉන්ද්‍රිය ගෝචර වන වස්තු පිළිබඳ ඥානය අප තුළ ජනිත වේ. එහෙත් මෙහි ආලෝකය නැත; මෙහි සීතල නැත; යනුවෙන් යමක නැති බව දැන ගත හැකි උක්තාකාරයේ සෛද්ධාන්තික ක්‍රමවේදයක් මුල් බුදුසමයේ දක්වා නොමැත. මේ හේතුවෙන් පශ්චාත් කාලීන බෞද්ධ දාර්ශනිකයන්ට නොපවත්නා වස්තුවක් නොමැති බව දැන ගන්නේ කෙසේ ද යන්න සඳහා බෞද්ධ සිද්ධාන්ත ඉදිරිපත් කිරීමට සිදු වූ හෙයින් බෞද්ධ සම්ප්‍රදායට අවේණික වූ අනුපලබ්ධි සිද්ධාන්ත ඉදිරිපත් කිරීමට සිදු විණි. මේ අනුව ධර්මකීර්ති පාදයන් මෙන් ම අනෙක් බෞද්ධ තාර්කිකයන් හඳුන්වා දුන් අනුපලබ්ධි සිද්ධාන්ත ප්‍රභේද කිහිපයක් ම අපට හමු වෙයි. මෙහි දී මූලික වශයෙන් අනුපලබ්ධිය දෙයාකාර වෙයි. එනම්,

(i) දෘශ්‍යානුපලබ්ධිය

(ii) අදෘශ්‍යානුපලබ්ධිය

## (i) දෘශ්‍යානුපලබ්ධිය

දෘශ්‍යානුපලබ්ධිය වනාහී යමක් ප්‍රත්‍යක්ෂ වීමෙහි ලා අවශ්‍ය කරුණු සපුරා තිබිය දීත් යම් වස්තුවක් ප්‍රත්‍යක්ෂ නො වීම යි. එනම්, සැබැවින් ම පවත්නා වස්තුවක ඉන්ද්‍රිය ගෝචර නො වීම යි. නිදසුන් ලෙස අප මෙහි පිසාචයෙකු සිටියි යැයි පවසන්නේ නම් එම පිසාචයා නිරීක්ෂණය කිරීමේ හැකියාව අප සතු ව තිබිය යුතු ය. එසේ ම එම පිසාචයා සතු ව යම් කෘත්‍ය ක්‍රියාවක් ද තිබිය යුතු ය. ඒ අනුව යමක් (පිසාචයා) පවතී නම් එ ද දෘශ්‍යමාන වීමේ හැකියාව මෙන් ම කෘත්‍ය ක්‍රියාවක් ද තිබිය යුතු අතර දෘශ්‍යමාන වීමේ හැකියාව තිබියදීත් එසේ දෘශ්‍යමාන නො වන්නේ නම්, එය දෘශ්‍යානුපලබ්ධිය යි. එනම් යමක් දෘශ්‍යානුපලබ්ධි වන්නේ නම්, එය සැබැවින් ම ප්‍රත්‍යක්ෂ කර ගත හැක්කක් විය යුතු ය. සාමාන්‍යයෙන් යමක් උපලබ්ධි වීමේ කාරණා කිහිපයකි.[9]

### (i) වස්තුව ස්වභාව විශේෂයෙන් යුක්ත වීම.

මෙහි ස්වභාව විශේෂය නම් එකී වස්තුවක් අනෙක් වස්තුවකින් වෙන් කොට හඳුනා ගැනීමේ ලක්ෂණය යි. සැම වස්තුවක් සාමාන්‍ය ස්වභාව හා විශේෂ ස්වභාව වශයෙන් දෙපරිදි ය. වෘක්ෂ වෘක්ෂත්වයෙන් අන් වෘක්ෂ හා සමාන වෙයි. මිනිසා මිනිස් බවින් අන් මිනිසුන් හා සමාන වෙයි. මේ ආදි වශයෙන් සාමාන්‍ය ස්වභාවය හේතුවෙන් එක් වස්තුවක් අනෙක් වස්තුවක් හා සමාන වෙයි. එහෙත් වෘක්ෂ අතුරින් මේ (පොල්, දෙල්, බෝ ආදි වශයෙන්) අසවල් වෘක්ෂය යැයි වෙන් වෙන් ව හඳුනා ගතහැකි වනුයේ ස්වභාව විශේෂය හේතුවෙනි. මිනිසුන් අතරින් ද මේ අසවල් මිනිසා යැයි හඳුනා ගැනෙන්නේ ද එමගිනි.

### (ii) වස්තුව දේශයෙන් හා කාලයෙන් ඈත් වීම

පුද්ගලයෙක් යම් වස්තුවක් උපලබ්ධි කරන්නේ නම් එම වස්තුව උපලබ්ධි කරන පුද්ගලයාගේ කාලය හා අවකාශය තුළ පැවතිය යුතු ය. එ නම් උපලබ්ධි කරන කාලය තුළ උපලබ්ධි කරන පුද්ගලයාගේ හා වස්තුවෙහි සමාන පැවැත්මක්, ඉන්ද්‍රිය විෂය පථය අතික්‍රමණය නො කරන ස්ථානයෙක්හි පැවතිය යුතු ය. නිදසුන් ලෙස අපට ලංකාවේ සිට ඇමරිකාවේ ධවල මන්දිරය පියවි ඇසින් ප්‍රේක්ෂා කළ නො හැකි ය. එසේ ප්‍රේක්ෂා කළ නො හැකි වූ පමණින් ඇමරිකාවේ ධවල මන්දිරයක් නැත යැයි ද කිව නො හැකි ය. ඒ අනුව දේශ ස්වභාව හෙවත් උපලබ්ධිය සඳහා දේශයෙන් (ඉන්ද්‍රිය විෂය පථයෙන්) ඈත් නො වී තිබිය යුතු ය. එසේ ම අනුරාධපුර රාජධානියේ ශ්‍රී විභූතිය අපට වත්මනේ සිට ප්‍රේක්ෂා කළ නො හැකි වන්නේ එය අපගේ කාලයෙන් ඈත් වී තිබීම හේතුවෙනි. එතෙකුදු වුවත් එ වැන්නක් නො තිබූ බව ද කිව හැකි නොහේ. එම ශ්‍රී විභූතිය අපට නො පෙනෙන්නේ එ ද අපගේ කාලයෙන් ඈත් වී

ඇති නිසා ය. මේ අනුව අපට යමක් උපලබ්ධි වන්නේ නම් එම අපගේ කාලයෙන් හා දේශයෙන් ඈත් නො වී තිබිය යුතු ය.

(iii) යෝග්‍ය දේශයෙක්හි වීම

(iv) ඉන්ද්‍රියන්ගේ අවිකලත්වය

(v) දර්ශන ප්‍රවෘත්තිය

මෙම කාරණා පඤ්චකය සම්පූර්ණ වූයේ නම් යම් වසතුවක් උපලබ්ධි කිරීමේ හැකියාව පවතින අතර එකක් වුව අඩු වුව යම් වස්තුවක් උපලබ්ධි නො වේ.

ධර්මකීර්ති පාදයන් **න්‍යායබින්දුවෙහි** දක්වන පරිදි මෙම උපලබ්ධි ලක්‍ෂණ සම්පූර්ණ වූයේ හෙවත් යම් වස්තුවක් පෙනීමට අවශ්‍ය කාරණා සියල්ල සම්පූර්ණ වී තිබියදීත් දෘශ්‍යමාන නො වන්නේ (නො පෙනේනේ) නම් එය අනුපලබ්ධිය නම් වෙයි. එ නම්, ප්‍රත්‍යක්‍ෂ ගෝචර වූ ප්‍රදේශ විශේෂයෙක්හි කිසි තැනෙක කලයෙක් නැත; (යැයි කිව හැක්කේ) උපලබ්ධිලක්‍ෂණප්‍රාප්ත වූ (හෙවත් ඉන්ද්‍රිය ගෝචර වීමෙහි ලා සියලු කාරණා සම්පූර්ණ වී තිබියදීත්) නො පැනෙන හෙයිනි.[10]මේ අනුව යම් වස්තුවක් නැතැයි නිශ්චය කිරීම මෙම අනුපලබ්ධියෙන් ම සිදු වන අතර වස්තුවක් (උපලබ්ධි ලක්‍ෂණ සහිත ව) ඇති කල්හි දෘශ්‍යානුපලබ්ධිය සිදු නො වේ.[11] දෘශ්‍යානුපලබ්ධිය සිදු නො වුණුයේ පූර්වෝක්ත දේශ, කාල හා ස්වභාව විශේෂයෙන් ඈත් වූ වස්තු විෂය ආත්මප්‍රත්‍යක්‍ෂ ගෝචර නො වන හෙයිනි. ඉන්ද්‍රියන්ට ගෝචර නො වන වස්තුන්ගේ පැවැත්ම හෝ නොපැවැත්ම නිශ්චිත වශයෙන් ම ප්‍රකාශ කළ නො හැකි ය. (ඇතැම් විට පැවතිය හැකි ය; නො එසේ නම් නොපැවතිය හැකි ය.) අනුපලබ්ධිය වූ කලී යථාර්ථ වශයෙන් හෝ පරමාර්ථ වශයෙන් යමක නිශේධය තහවුරු කිරීම නො ව අභාව ව්‍යවහාරය (හෙවත් නැති බව) නිශ්චය කිරීම යි.[12]

යම් වස්තුවක් නැතැයි නිශ්චය කිරීම දෘශ්‍යානුපලබ්ධියෙන් සිදු වන හෙයින් ඊට උපකාරී වනුයේ අතීත හා වර්තමාන ප්‍රත්‍යක්‍ෂ ඥානය යි. නිදසුන් ලෙස කළය (නම් වස්තුව) අනුපලබ්ධි වන්නේ යැයි සිතමු. එසේ මෙතැන්හි කළය අනුපලබ්ධි වන බව හෙවත් කළය නැත යනුවෙන් අප වටහා ගනුයේ අතීතයේ (හෙවත් මීට පෙර) කළය යනුවෙන් යම් වස්තුවක් අප ප්‍රත්‍යක්‍ෂ කොට ඇති හෙයිනි. යම් හෙයකින් මීට පෙර කළය යනුවෙන් යම් වස්තුවක් අප ප්‍රත්‍යක්‍ෂ කර නොමැති නම් හෝ එවැන්නක් පිළිබඳ ඥානයක් අප සතු ව නො පවතී නම් එවැනි වස්තුවක් මේ මොහොතේ මෙතැන නැත යන්න (හෙවත් අභාව ව්‍යවහාරය) අපට වටහා ගත නො හැකි වෙයි. එසේ ම වර්තමාන (හෙවත් මේ මොහොතේ) කළය පිළිබඳ යම් ඥානයක් අප වෙත ඇත්නම් කලය පිළිබඳ අනුපලබ්ධි ඥානය අපට ලබා ගත හැකි වෙයි. ධර්මකීර්ති පාදයන් මෙ ලෙස වර්තමානයේ යමක් නැති බව නිශ්චිත වශයෙන් ම (අපට) කිව හැකි වීම හෙවත් අභාව ව්‍යවහාරය සඳහා පුද්ගලයාට පූර්වයෙන් ප්‍රත්‍යක්‍ෂ වූ එමෙන් ම ඒ පිළිබඳ මුළා නො වූ ස්මෘතිය (නිවැරදි මතකය) හේතු කාරක වන බව දක්වති.[13] මෙහි දී අතීත මතකය පිළිබඳ සිතිවිලි පරම්පරාව අතරමඟ

බිඳී ගියේ වී නම් එය ස්මරණව්‍යභිචාරී හෙවත් සිහි මුළා වීමක් වූයේ වෙයි. එසේ වූයේ නම් අතීත ප්‍රත්‍යක්ෂය වර්තමාන අනුපලබ්ධියෙහි ලා ප්‍රාමාණික නො වෙයි. යම් වස්තුවක් පිළිබඳ අනාගත ඥානය අසිද්ධ වූවක් ම හෙයින් එය ද ප්‍රමාණ නො වෙයි. එහෙයින් අනුපලබ්ධි විෂයෙහි අතීත ඥාන හා වර්තමාන ඥාන යන ද්විත්වය පමණක් ප්‍රාමාණික වෙයි. මීට අමතර ව යම් වස්තුවක අභාව ව්‍යවහාරය සඳහා කෘතාභාස හෙවත් ඒ පිළිබඳ වන නෛපුණ්‍යත්වය වැදගත් වෙයි. නිදසුන් ලෙස මැණික්කරුවා යම් මැණිකක් කෘත්‍රිම හෝ අකෘත්‍රිම බව වටහා ගන්නේ ඒ පිළිබඳ නෛපුණ්‍යත්වය හෙවත් කෘතාභාස හේතුවෙනි. මෙය ද අනුපලබ්ධි විෂයෙහි උපයෝගී වන්නක් වෙයි.

අනුපලබ්ධිය මගින් යම් වස්තුවක උච්ඡේදය හෝ නාස්තිත්වය තහවුරු නො කරන බව මෙහි ලා සඳහන් කළ යුතු ය. නො එසේ නම් එ මගින් උච්ඡේදවාදය හෝ නාස්තිකවාදය තහවුරු කිරීමක් වන හෙයිනි. අනුපලබ්ධිය මගින් තහවුරු කරනුයේ අභාව ව්‍යවහාරය යි. අභාව ව්‍යවහාරය යනු හුදෙක් නිවෘත්ති මාත්‍රය නො වේ. සම්මුති ලෝකයෙහි පවත්නා වස්තුවක් මේ මොහොතේ දෘශ්‍යමාන නො වන්නේ නම් එය දෘශ්‍යමාන නො වන බව අපට දැන ගත හැක්කේ කෙසේ ද යන්න පිළිබඳ සිද්ධාන්ත කථනය මෙහි ලා මූලික කාරණය යි. දෘශ්‍යමාන වස්තුවක් පවතී නම් එම වස්තුව දෘශ්‍යමාන වන්නේ ද නම් ඒ වූ කලී දෘශ්‍යෝපලබ්ධිය යි. දෘශ්‍යමාන වන වස්තුවක් නො පවතී ද එය දෘශ්‍යමාන වීමෙහි ලා අවශ්‍ය සාධක ද පවතී ද නමුත් එය දෘශ්‍යමාන නො වන්නේ ද එ ද දෘශ්‍යානුලපබ්ධිය යි. යමක් නැත යැයි වචනයෙන් කිව හැක්කේ අභාව ව්‍යවහාර යැ. එය මානසික, කායික හා වාචසික වශයෙන් තෙයාකාර වෙයි. ඒ වස්තුව මෙහි නැතැයි වටහා ගැනීම මානසික ව්‍යවහාරය යි. එය නැතැයි කායික ඉරියව් මගින් නිශ්චය කර ගැනීම කායික ව්‍යවහාරය යි. නැතැයි යනුවෙන් වචනයෙන් පැවසීම වාචසික ව්‍යවහාරය යි.

මේ සියලු කරුණු සලකා බැලීමෙන් පැහැදිලි වන්නේ දෘශ්‍යානුපලබ්ධිය යනු ප්‍රත්‍යක්ෂ කර ගත හැකි වස්තුන්ගේ නොපෙනී යාම හෙවත් ඉන්ද්‍රිය ගෝචර නො වීම යි. එය ප්‍රත්‍යක්ෂ නො වන බව දැන ගත හැක්කේ කෙසේ ද යන්න යි.

## (ii) අදෘශ්‍යානුපලබ්ධි

බෞද්ධ තාර්කිකයන් දෘශ්‍යානුපලබ්ධිය පිළිගත්තේ නමුත් අදෘශ්‍යානුපලබ්ධිය නො පිළිගනියි. ඒ අදෘශ්‍යානුපලබ්ධිය සැබැවින් ම ඉන්ද්‍රිය ගෝචර නො වන වස්තුවක නො පෙනීයාම තහවුරු කරන හෙයිනි. නෛයායිකයන් ඇතුළු බ්‍රාහ්මණ දාර්ශනිකයෝ බ්‍රහ්මගේ (ජගදාත්මය) හා ආත්මයේ (පුද්ගලාත්මය) පැවැත්ම පිළිගත්හ. එ ද ප්‍රත්‍යක්ෂයෙන් ඔබ්බෙහි පවත්නා, ඉන්ද්‍රිය ගෝචර නො වන, භාෂාවෙන් පමණක් ප්‍රත්‍යක්ෂ කරගත හැකි දෑ ය. එහෙයින් ඉන්ද්‍රිය ගෝචර නො වන එවැනි දෑ හි නොපෙනී යාම තහවුරු කිරීම සඳහා කරුණු ඉදිරිපත් කරන හෙයින් දෙවියන්ගේ හා ආත්මයේ පැවැත්ම මෙ මගින් තහවුරු කරන ලදි; හෙවත් ප්‍රත්‍යක්ෂ නො වන (ඒ පිළිබඳ අතීත හෝ අනාගත හෝ වර්තමාන ඥානයක් නොමැති) එහෙත් සැබැවින් ම පවතින්නේ යැයි උපකල්පනය කරන වස්තුවක ප්‍රවෘත්තිය තහවුරු කිරීම

යි. කුමාරිලභට්ට ආදි ඇතැම් තාර්කිකයන් මෙම අදෘශ්‍යානුපලබ්ධිය පිළිගත් අතර එමගින් උක්ත අභිමථාර්ථ සාධනය සිදු කරන ලදි.

ධර්මකීර්ති පාදයෝ ප්‍රත්‍යක්ෂයේ ප්‍රභේද පිළිබඳ කරණු ලබන විග්‍රහයේ සිව්වැන්න යෝගී ප්‍රත්‍යක්ෂය වශයෙන් දක්වති. යෝගී ප්‍රත්‍යක්ෂය යනු පවතින්නා වූ යම් වස්තුවක් මෙනෙහි කිරීමෙන් තීව්‍ර ලෙස වටහා ගනී ද එහි කෙළවර හට ගන්නා ඥානය යි.[14] මෙය මනෝනිර්මිත වස්තුවක් හෙවත් ප්‍රත්‍යක්ෂ ගෝචර නො වන දෙයක් ඇසුරින් ඇති වන්නක් නො ව සැබැවින් ම පවත්නා වස්තුවක් ඇසුරින් හට ගන්නකි. එහෙයින් මෙය චතුරාර්ය සත්‍යය වැනි යැයි ධර්මකීර්ති පාදයෝ දක් වූහ.[15] මෙහි දී කුමාරිලභට්ටාදීන් විසින් භාවනාවෙන් පමණක් ප්‍රත්‍යක්ෂ කර ගත හැකි ඉන්ද්‍රියප්‍රත්‍යක්ෂයට ගෝචර නො වන එහෙත් සැබැවින් ම පවතින (යැයි උපකල්පනය කරන) දෙවියන් හා ආත්මන් පිළිබඳ සංකල්පය උක්ත යෝගී ප්‍රත්‍යක්ෂය හා සාදෘශ්‍ය නො වන බව සැලකිය යුතු ය. ඒ පළමු ව චතුරාර්ය සත්‍යය පිළිබඳ ප්‍රත්‍යක්ෂ ඥානයෙන් වටහා ගෙන ඒ වැටහීම ඔස්සේ භාවනා කිරීමෙන් යෝගී ප්‍රත්‍යක්ෂය සිදු වන හෙයිනි. ඒ විනා නො පවතින යමක් ආශ්‍රය කර ගනිමින් යෝගී ප්‍රත්‍යක්ෂය සිදු නො වන හෙයිනි.

## අනුපලබ්ධි ප්‍රභේද

ධර්මකීර්ති පාදයෝ අනුපලබ්ධිය වූ කලී දෘශ්‍යානුපලබ්ධියක් විය යුතු ම බව දක්වති.[16] ප්‍රමාණවාර්තිකයේ දී ධර්මකීර්ති හිමි දක්වනුයේ අනුපලබ්ධි සතරක් පමණි. එනම්,

ස්වභාව අනුපලබ්ධි

කාරණා අනුපලබ්ධි

ව්‍යාපක අනුපලබ්ධි

විරුද්ධ අනුපලබ්ධි[17]

එහෙත් **න්‍යායබින්දුවෙහි** අනුපලබ්ධි ප්‍රභේද එකළොසක් දක්වෙන අතර **න්‍යායබින්දු ටීකාවෙහි** අනුපලබ්ධි දහසයක් (16) දක්වෙයි. දුර්වේකමිශ්‍ර විසින් විරචිත **ධර්මාර්ථප්‍රදීප** කෘතියෙහි මෙන් ම මෝක්ෂාකරගුප්ත හිමියන්ගේ **තර්කාභාස** කෘතියෙහි ද අනුපලබ්ධි දහසය බැගින් දක්වෙයි.

## න්‍යායබින්වාගත අනුපලබ්ධි ප්‍රභේද

### i. ස්වභාවානුපලබ්ධි

මෙය අනුපලබ්ධියේ මූලික ම අවස්ථාව යි. යම් වස්තුවක ස්වභාවය ගෝචර නොවීම ස්වභාවානුපලබ්ධිය යි. එනම් මෙහි දී පෙනෙන දෙයක් පසු ව නොපෙනී යාම අදහස් කරයි.[18]

නිදඃ


දුම නැත.          කලය නැත.

ආදි වශයෙනි.

මෙහි විශේෂත්වය වනුයේ උපලබ්ධි වීමට කාරණා තිබිය දී අනුපලබ්ධිය වීම යි.


**ii. කාර්යානුපලබ්ධිය**

කාර්ය යනු ඵලය වන අතර කාරණ යනු හේතුව යි. නිදසුන් ලෙස මෙහි දී දුම කාර්ය වන අතර කාරණ වනුයේ ගින්න යි. ස්වභාවානුපලබ්ධියෙන් දුම නැති බව දැන ගත් විට කාරණ (හේතුව) වන ගින්න ද අනුපලබ්ධි වෙයි.[19]





**iii. ව්‍යාපකානුපලබ්ධි**

මෙය ව්‍යාප්‍ය-ව්‍යාපක සම්බන්ධතාව මත සිදු වන අනුපලබ්ධිය යි. ව්‍යාපක යනු මහාකුලකය වන අතර ව්‍යාප්‍ය යනු එහි අනුකුලකය යි. ඒ අනුව ගස් යන මහාකුලකය (ව්‍යාපක) නොමැති කල්හි එහි අනුකුලකය වන ශිංශපා, පොල් ආදියෙහි (ව්‍යාප්‍ය)අභාවය වෙයි.[20]





**iv. ස්වභාව විරුද්ධෝපලබ්ධි**

යම් ස්වභාවයකවිරුද්ධ ස්වභාවය උපලබ්ධි වන්නේ නම් එකී යම් ස්වභාවය අනුපලබ්ධි වෙයි.





මෙහි දී ගින්න උපලබ්ධි කරන කල්හි එහි විරුද්ධ ස්වභාවය වූ සීතල අනුපලබ්ධි වෙයි.[21] මෙපරිදි ම මෙහි විරුද්ධ ස්වභාවය වූ ආලෝකය උපලබ්ධි කිරීම මගින් ස්වභාවය වූ අඳුර අනුපලබ්ධි වන වටහා ගත හැකි වෙයි. මෙහි ලිඞ්ගය (හේතුව) ගින්න වන අතර සාධ්‍ය පදය සීතල නැත; යන්න යි.




**v. විරුද්ධකාර්යෝපලබ්ධි**

යම් තැනක දුම උපලබ්ධි වන විට එහි ගිනි ඇති බව දැන ගත හැකි ය. ඒ තාදාත්ම්‍ය සම්බන්ධයෙනි. ගිනි ඇති බව දැන ගත් කල්හි එහි ස්වභාවයට විරුද්ධ වූ ස්වභාවය වන සීතල අනුපලබ්ධි වෙයි. මෙහි කාර්ය (ඵලය) දුම වන අතර කාරණය (හේතුව)ගින්න යි. ඒ අනුව ගිනි උපලබ්ධි වන විට එහි විරුද්ධ ස්වභාවය වන සීතල අනුපලබ්ධි වෙයි.[22]



**vi. විරුද්ධව්‍යාප්තෝපලබ්ධි**


ලිඞ්ගය හෙවත් හේතුව මගින් තහවුරු කිරීමට අවශ්‍ය කරුණ නො ව වෙනත් කරුණක් තහවුරු වීම විරුද්ධව්‍යාප්තෝපලබ්ධිය යි.[23] නිදසුන් ලෙස කළයෙහි අනිත්‍යතාව තහවුරු කිරීම සඳහා එය විනාශ කිරීමට සමත් මුගුර ලිඞ්ගය ලෙස දැක්වීම මගින් කළයෙහි අනිත්‍යතාව නො ව මුගුර නොමැති නම් කළයෙහි නිත්‍යතාව සිදු වන බව තහවුරු වෙයි. එනම්,

කළය අනිත්‍ය යි; මුගුර නිසා.

මෙහි දී මුගුර නොමැති වූයේ නම් කළය නිත්‍ය වස්තුවක් වෙයි. ඒ අනුව කළයෙහි අනිත්‍යතාව තහවුරු කිරීම උදෙසා දක්වන හේතුව (මුගුර) මගින් කළයෙහි අනිත්‍යතාව නො ව ඊට විරුද්ධ කලයෙහි නිත්‍යත්වය තහවුරු වෙයි. මෙහි දී මුගුර උපලබ්ධි වන අතර කළයෙහි අනිත්‍යතාව අනුපලබ්ධි වෙයි.


**vii. කාර්යවිරුද්ධෝපලබ්ධිය**

යම් කාර්යකට හෙවත් ඵලයකට විරුද්ධ වූ කාර්ය උපලබ්ධි කරන විට එකී කාර්යාගේ (ඵලයෙහි) අනුපලබ්ධිය වෙයි. එම කාර්ය අනුපලබ්ධි වන විට එහි කාරණ (හෙවත් හේතුවෙහි ද) අනුපලබ්ධිය වෙයි.[24]




### viii. ව්‍යාපකවිරුද්ධෝපලබ්ධිය

ව්‍යපක යනු මහාකුලකය වන අතර ව්‍යාප්‍ය යනු අනුකුලකය යි. මෙහි දී යම් ව්‍යාපකයට හෙවත් මහා කුලකයට විරුද්ධ වූ දෙය උපලබ්ධි කරන විට එකී ව්‍යපකයා සහ ව්‍යාප්‍යයාගේ (මහාකුලකයේ හා අනුකුලකයේ) අනුපලබ්ධිය වෙයි.[25]




### ix. කාරණානුපලබ්ධිය


කාරණ හෙවත් හේතුව අනුපලබ්ධි වන විට එයින් ජනිත කාර්ය හෙවත් ඵලය ද අනුපලබ්ධි වෙයි.[26]මෙහි දී කාරණකාර්ය සම්බන්ධය හෙවත් හේතුව හා ඵලය අතර ඇති සම්බන්ධය සලකා බැලේ.




පූර්වයෙන් හෙවත් දෙවන (ii)අනුපලබ්ධියෙන් කාර්ය, අනුපලබ්ධි වන විට කාරණය ද අනුපලබ්ධි වන බව විග්‍රහ කෙරෙන අතර මෙහි දී කාරණයාගේ අනුපලබ්ධියෙන් කාර්යාගේ අනුලපබ්ධිය වන ආකාරය පෙන්වා දෙයි.

### x. කාරණවිරුද්ධෝපලබ්ධිය


යම් කාරණයකට හෙවත් හේතුවකට විරුද්ධ වූ කාරණය උපලබ්ධි කරන විට එකී යම් කාරණයාගේ අනුපලබ්ධිය වෙයි.[27]




මෙහි දී සැලකිය යුත්ත නම් විරුද්ධ හේතුන් දෙකක් හෙවත් කාරණ ද්විත්වයක් එකට නො යෙදීම යි. සීතල හේතුවෙන් ලොමුදැහැ ගැනීම හෙවත් රෝමෝද්ගමනය සිදු වේ. එය කාර්යකාරණ සම්බන්ධයෙන් දත යුතු ය. මෙහි ලා සීතල යන්නෙහි විරුද්ධ කාරණය (හේතුව) වූ තාපය (දහන විශේෂය) උපලබ්ධි වන කල්හි සීතල අනුපලබ්ධි වන අතර කාරණ වූ සීතලෙහි අනුපලබ්ධියෙන් එහි කාර්ය වූ ලොමුදැහැ ගැනීම අනුපලබ්ධි වෙයි.

**xi. කාරණවිරුද්ධකාර්යෝපලබ්ධිය**

යමක කාරණය (හෙවත් හේතුවට) විරුද්ධ වූ කාර්යයෙහි (හෙවත් ඵලයෙහි) උපලබ්ධිය කාරණවිරුද්ධකාර්යෝපලබ්ධිය යි.[28]




ලොමුදැහැ ගත් පුද්ගලයකු නැත යැයි දැන ගනුයේ සීතල නැති බව දැන ගැනීමෙනි. මෙහි සීතල කාරණ වන අතර එහි කාර්ය වනුයේ ලොමුදැහැ

> ගැනීම යි. එ ද දැන ගනුයේ කාරණකාර්ය සම්බන්ධයෙනි. සීතල නැති බව දැන ගනුයේ විරුද්ධකාරණෝපලබ්ධියෙනි. නම් සීතලට විරුද්ධ කාරණ වූ ගිනි ඇති බව දැන ගැනීමෙනි. ගිනි ඇති බව දැන ගනුයේ කාර්යෝපලබ්ධියෙනි. ගින්නෙහි කාර්ය වන දුම උපලබ්ධි කරන කල්හි (හෙවත් ඉන්‍ද්‍රිය ගෝචර වන කල්හි) එහි කාර්ය වන ගිනි පැවතිය යුතු යි. ඒ කාර්යකාරණ සම්බන්ධයෙනි. ගිනි ඇති කල්හි එහි සීතල නැති බව දැන ගනුයේ කාරණවිරුද්ධොපලබ්ධියෙනි. ඒ අනුව සීතල නොමැති කල්හි ලොමුදැහැ ගැනීමක් නැති බව දැන ගනුයේ කාරණානුපලබ්ධියෙනි.

දුර සිටිය පුද්ගලයෙකුට යම් තැනක වන ගිනි නො පෙනේ නම්, එහි වන සීත ස්පර්ශය ද නොදැනේ නම්, ලොමුදැහැගත් පුද්ගලයා ද නොපෙනේ නම්, එහෙත් දුම පමණක් දෘශ්‍යමාන වන්නේ නම් එකල්හි මේ අනුපලබ්ධිය ප්‍රමාණ වෙයි.

## සමාලෝචනය

අනුපලබ්ධිය, බෞද්ධ තාර්කිකයන් පමණක් නො ව අන්‍ය න්‍යායවෛශේෂික දාර්ශනිකයෝ ද පිළිගත්හ. බෞද්ධ දාර්ශනිකයන් අනුපලබ්ධි ප්‍රභේද ද්විත්වය අතුරින් දෘශ්‍යානුපලබ්ධිය පමණක් පිළිගත් අතර අන්‍ය දාර්ශනිකයෝ අදෘශ්‍යානුපලබ්ධිය ද පිළිගත්හ. බෞද්ධ සම්ප්‍රදායේ දැකිය හැකි අනුපලබ්ධි පිළිබඳ විග්‍රහයෙහි පුරෝගාමීහු ධර්මකීර්ති පාදයෝ ය. ප්‍රත්‍යක්ෂ ඥානය පිළිබඳ විග්‍රහය මුල් බුදු සමයේ පවා දැකිය හැකි මුත් ප්‍රත්‍යක්ෂ ගෝචර නො වන දෙය පිළිබඳ දැන ගත හැකි ක්‍රමවේදයක් බෞද්ධ සම්ප්‍රදායේ නොදිස් වන බවට එල්ල වූ දෝෂයන්ට ප්‍රතිචාර වශයෙන් බෞද්ධ අනුපලබ්ධි සිද්ධාන්ත විග්‍රහ විණි. මෙහි දී අනුලපලබ්ධිය වශයෙන් ඉන්‍ද්‍රිය ගෝචර නොවීම අදහස් කෙරෙන අතර තහවුරු කෙරෙනුයේ අභාව ව්‍යවහාරය පමණි. මේ සඳහා ධර්මකීර්ති පාදයෝ ස්වභාවානුපලබ්ධි ආදි වශයෙන් අනුපලබ්ධි ප්‍රභේද එකොළොසක් පිළිබඳ ව **න්‍යායබින්දුවෙහි** විග්‍රහ කරයි.

## ආන්තික සටහන්

1 ප්‍රමාණවාර්තිකය හා ස්වාර්ථානුමානයට කරන ලද **ස්වොපඥවෘත්ති, ප්‍රමාණ විනිශ්චය, න්‍යායබින්දු, හේතුබින්දු, සම්බන්ධ පරීක්‍ෂා, වාදන්‍යාය, සන්තානන්තර සිද්ධි.**

2 'පරාර්ථානුමානං ශබ්දාත්මකං ස්වාර්ථානුමානං තු ඥානාත්මකං' Peterson, Peter (Edi.) (1929). **The Nyayabindu-Tika Of Dharmottara Acharya**. Calcutta : Asiatic Society of Bengal, 21p.

3 'ත්‍රිරූපාල්ලිඞ්ලාද්යදනුමේයේ ඥානං තදනුමානං' සුමනසාර, කරගම්පිටිගොඩ (1953). **න්‍යායබින්දු සුමනසාර ව්‍යාඛ්‍යා**. කළුතර : විද්‍යාතිලක මුද්‍රණාලය, 31 පිට.

4 'ත්‍රිරූපලඞ්ගාඛ්‍යානං පරාර්ථානුමානං' සුමනසාර, කරගම්පිටිගොඩ (1953). **න්‍යායබින්දු සුමනසාර ව්‍යාඛ්‍යා**. කළුතර : විද්‍යාතිලක මුද්‍රණාලය, 71 පිට.

5 'ත්‍රිරූපාණි ච ත්‍රීණෙව ලඞ්ගානි අනුපලබ්ධි ස්වභාව කායේ චෙති....එම...

6 'සකවාදි පුච්ඡාඃ උපලබ්භති පුරිසො සච්චිකට්ඨපරමත්‍ථේනාති (සත්‍යාර්ථ (භූතාර්ථ) පරමාර්ථ (ආත්මප්‍රත්‍යක්ෂා සංඛ්‍යාත උත්තමාර්ථ) වශයෙන් පුද්ගලයෙක් (ආත්මයෙක්) උපලම්භ්‍යමාන වේ ද? (නුවණ එළවා දක්නා ලැබේ ද?)) කථාවත්‍ථුප්පකරණ 1, 1-2 පිටු.

7 මලලසේකර, ගුණපාල (2014)(සංස්.). **මලලසේකර ඉංග්‍රිසි - සිංහල ශබ්දකෝෂය.** කොළඹ : ගුණසේන සහ සමාගම, 1167 පිට.

8 'චක්ඛුං පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං තිණ්ණං සංගති ඵස්සො' ම.නි 1, ...

9 සුමනසාර, කරගම්පිටිගොඩ (1953). **න්‍යායබින්දු සුමනසාර ව්‍යාඛ්‍යා.** කළුකර : විද්‍යාතිලක මුද්‍රණාලය, 42 පිට.

10 'න ප්‍රදේශවිශෙෂෙ ක්වචිද්ඝට උපලබ්ධිලක්‍ෂණප්‍රාප්තස්‍යානුපලබ්ධරිති....එම... 40 පිට.

11 'ප්‍රතිෂෙධසිද්ධිරපි යථොක්තායා එවානුපලබ්ධෙඃ සති වස්තුනි තස්‍ය අසම්භාවාත්....එම... 49 පිට.

12 'අන්‍යථා චානුපලබ්ධිලක්‍ෂණප්‍රාප්තෙෂු දෙශකාලස්වභාවවිප්‍රකෘෂ්ටෙෂ්වාත්මප්‍රත්‍යක්‍ෂනිවෘත්තෙරභාව නිශ්චයාභාවාත්..එම...

13 'අමූඪස්මෘතිසංස්කාරස්‍යාතීතස්‍ය වර්තමානස්‍ය ච ප්‍රතිපත්තෘප්‍රත්‍යක්‍ෂස්‍ය නිවෘත්තිරභාවව්‍යවහාරසාධනී..එම... 50 පිට.

14 'භූතාර්ථභාවනාප්‍රකර්ෂපර්යන්තජං යොගිඥානං චෙති....එම... 1 පිට.

15 'තථා චත්වාර්යාර්යසත්‍යානි' Peterson, Peter (Edi.) (1929). **The Nyayabindu-Tika Of Dharmottara Acharya.** Calcutta : Asiatic Society of Bengal, 14p.

16 'තස්‍යානුපලම්භො දෘශ්‍යානුපලම්භඃ ...එම...26 පිට.

17 'දෘශ්‍යාත්මනොරභාවාත්මනුපලබ්ධිශ්චතුර්විධඃ තත්විරුද්ධනිමිත්තස්‍ය සොපලබ්ධි ප්‍රයුජ්‍යතෙ'Shastri, Dwarikadas (Edi.) (1968). **Pramanavartika.**Varanasi : Buddha Bharati, 1p.

18 'නාත්‍ර ධූමඃ උපලබ්ධිලක්‍ෂණප්‍රාප්තස්‍යානුපලබ්ධෙරිති' සුමනසාර, කරගම්පිටිගොඩ (1953). **න්‍යායබින්දු සුමනසාර ව්‍යාඛ්‍යා.** කළුතර : විද්‍යාතිලක මුද්‍රණාලය, 53 පිට.

19 'නෙහාප්‍රතිබද්ධසමර්ථ්‍යානි ධූමකාරණානිසන්ති. ධූමාභාවාත්....එම... 54 පිට.

20 'නාත්‍ර ශිංශපා වෘක්‍ෂභාවාදිති....එම... 55 පිට.

21 'නාත්‍ර ශීතස්පර්ශෝ'ග්නෙරිති....එම...

22 'නාත්‍ර ශීතස්පර්ශෝ ධූමාදිති'...එම... 56 පිට.

23 'න ධ්‍රුවභාවී භූතස්‍යාපි භාවස්‍ය විනාශොහෙත්වන්තරාපෙක්‍ෂණාදිති....එම... 57 පිට.

24 'නෙහාප්‍රතිබද්ධසාමර්ථ්‍යානි ශීතකාරණානිසන්ති. අත්නෙරිති....එම... 59 පිට.

25 'නාත්‍ර තුෂාරස්පර්ශෝ'ග්නෙරිති....එම... 60 පිට.

26 'නාත්‍ර ධූමො'ග්න්‍යභාවාදිති....එම... 61 පිට.

27 'නාස්‍ය රොමහර්ෂාදිවිශෙෂඃ සන්නිහිතදහනවිශෙෂත්වාදිති....එම... 62 පිට.

28 'න රොමහර්ෂාදිවිශෙෂයුක්තපුරුෂවානයං ප්‍රදේශො ධූමාදිති....එම... 63 පිට.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය


අභයසිංහ (1945). **න්‍යාය බින්දු දීපිකා.** කොළඹ : ඇම්.ඩී ගුණසේන සමාගම.

සුමනසාර, කරගම්පිටිගොඩ (1953). **න්‍යායබින්දු සුමනසාර ව්‍යාඛ්‍යා.** කළුතර : විද්‍යාතිලක මුද්‍රණාලය.

විජිතධම්ම, මැදගම්පිටියේ (2007). **න්‍යයබින්දුඃ.** කොළඹ : සමයවර්ධන පොත්හල

Shastri, Dwarikada (Edi.) (1994). **Nyayabindu of Acharya Dharmakirtti.**Varanasi : Buddha Bharti, 17p.

Shastri, Dwarikadas (Edi.) (1968). **Pramanavartika.**Varanasi : Buddha Bharati.

Peterson, Peter (Edi.) (1929). **The Nyayabindu-Tika Of Dharmottara Acharya**. Calcutta : Asiatic Society of Bengal.

Sankrityayana, Rahula (Edi.) (1938). **The Journal of Bihar and Orissa research Society vol. - xxiv**. Patna : Bihar and Orissa research Society.

## ද්විතීය මූලාශ්‍රය

අභයසිංහ(?). **භාරත තර්ක ශාස්ත්‍රය.** කොළඹ: මහා බෝධි මුද්‍රණාලය.

පඤ්ඤාකිත්ති, කොටහේනේ ( 1959). **න්‍යායප්‍රවේශය හා න්‍යාය බෝධිය.** කොළඹ: විද්‍යාලංකාර විශ්වවිද්‍යාල පර්යේෂණ ආයතනය.

පඤ්ඤාකිත්ති, හිරිපිටියේ (පරිවර්තන)(2002). **සායණ මාධව රචිත සර්ව දර්ශන සංග්‍රහය.** කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ.

සීලරතන, වරකාගොඩ (2012). **තර්ක සංග්‍රහ විවරණ.** කොළඹ: සමයවර්ධන පොත්හල.

හිරියන්න, ඇම්. (2014). **සංක්ෂිප්ත ඉන්දීය දර්ශනය.** කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

Stcherbatsky, TH (2008). **Buddhist Logic volume-1**.Delhi : Matilal Banarsidass Publisher.

Stcherbatsky, TH (2008). **Buddhist Logic volume-2**.Delhi : Matilal Banarsidass Publisher.

Vidyabhusana, Stis Chandra (1921). **History of Indian Logic**. Culcutta : Culcutta University.

## ශාස්ත්‍රීය ලිපි

ධම්මානන්ද, මකුරුප්පේ (2013). 'න්‍යාය බින්දුව : අන්තර්ගතය පිළිබඳ කෙටි සමාලෝචනයක්.' සිරිසුගත, පැලවත්තේ, අසස්ජි, ලුණුගම්වෙහෙරේ (සංස්.) **විදු සතර- සමර්චනා ශාස්ත්‍රීය සංග්‍රහය** 226-237 පිටුව, හිපන්කන්ද : විද්‍යසමාධි ආදිශිෂ්‍ය සංගමය.

විමලජෝති, මාදිපොල (2018). 'තර්ක සංග්‍රහයට අනුව ප්‍රත්‍යක්ෂය, අනුමානය, අනුපලබ්ධි, හේත්වාභාස පිළිබඳ කෙටි හැඳින්වීමක්.' විමලඤාණ, පත්බේරියේ (ශාස්ත්‍රීය සංග්‍රහ කමිටු ප්‍රධානී) **ශාස්ත්‍රීය සංග්‍රහය 2011-2018** 292-310 පිටු, කොළඹ : ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම.

Liyanage, Bertram G. **Logical and Causal Realation in Dharmakirti's Logic**. (Unpublished)

Tillemans , T (2016). **'Dharmakīrti'***Standford Encyclopedia of Philosophy*

## ශබ්දකෝෂ

සෝරත. වැලිවිටියේ (2011). **ශ්‍රී සුමංගල ශබ්දකොෂය - ඞිතීය භාගය.** කොළඹ : ගොඩගේ සහ සහෝදරයෝ.

Rhys Davids, T.W and Willaim, Stedy (2004). **Pali-English Dictionary**. London : Pali Text Society

## දේශන අත්පිටපත්

බර්ට්‍රම් ජී. ලියනගේ.